**“අපි වෙනුවෙන් අපි”ව්‍යපෘතිය යටතේ ඉදිවූ තවත් නිවාස 27 ක් ජනපති අතින් රණවිරු අයිතියට**

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක “අපි වෙනුවෙන් අපි” නිවාස ව්‍යපෘතියෙහි දෙවන අදියර ලෙස කුරුණෑගල තෝරයාය ප්‍රදේශයේ ඉදිකළ නව නිවාස 27 ක් රණවිරුවන් වෙත පවරා දීම අද (සැප්තැම්බර් 05) උදෑසන අතිගරු ජනපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිනි.

මිය ගිය රණවිරුවන් සිහිකිරීම වෙනුවෙන් විනාඩි 02ක් නිශ්ශබ්දතාවයකින් අනතුරුව ඇරඹි මෙම උත්සවයේ දී පළමුව 2007 වර්ෂයේ දෙසැම්බර් මස ෙඩල්ෆ් දූපත අසලදී රටේ ඒකීයභාවය වෙනුවෙන් සටන් වැද දිවි පිදූ නාවික සුළු නිළධාරී ටීඑම්ආර්කේ තෙන්නකෝන් රණවිරුවාගේ බිරිද වන කේවීආර්ටී ජයසූරිය මහත්මිය වෙත ජනාධිපති තුමන් අතින් නිවසේ යතුර භාරදෙනු ලැබීය.

අනතුරුව පැවති උත්සව සභාවේදී අතිගරු ජනාධිපති තුමන් අතින් අනෙකුත් රණවිරු නිවෙස් වල යතුරු භාරදීම සිදුකල අතර, රණවිරුවන්ගේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ සහ නව නිවාස සඳහා ගෘහ උපකරණ කට්ටල පිරිනැමීමක් ද මෙහිදී සිදුවිය.

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකයේ සභාපතිනී අයෝමා රාජපක්ෂ මැතිණියගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුනි .

ආරක්ෂක අමාත්‍යාංශයීය සේවා වනිතා ඒකකය මඟින් විශේෂයෙන් පිළියෙල කල පොදු ආකෘතියක් යටතේ මෙම නිවාස ඉදිකර ඇත. නිදන කාමර තුනක්, විසිත්ත කාමරයක්, මුළුතැන්ගෙයක්, කෑම කාමරයක්, නාන කාමරයකින් සමන්විත මෙම නිවසක වටිනාකම රුපියල් මිලියන දෙකකට අධික වන අතර, මෙම නිවාස ගොඩනැඟීමෙහිලා ශ්‍රම දායකත්වය සැපයූයේ ශ්‍රී ලංකා නාවික හමුදාාව විසිනි.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ආරක්ෂක අමාත්‍යාංශයීය සේවා වනිතා ඒකකයේ සභාපතිනී අයෝමා රාජපක්ෂ මැතිණිය, වයඹ මහ ඇමති, වයඹ ආණ්ඩුකාරතුමා, ත්‍රිවිධ හමුදාපතිවරුන් ඇතුළු ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිළධාරීන්, ප්‍රාදේශීය ප්‍රභූන්, රණවිරුවන්, ඔවුන්ගේ දෙමව්පිය සහ ඥාති හිතවතුන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගිවිය.